# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අනුබද්ධ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානවල සේවයේ නියුතු විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022

01. විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සඳහා දෙවන කාර්යක්මතා කඩඉම් විභාගය සිංහල, දෙමළ භාෂා වලින් 2022 දෙසැම්බර් මස කොළඹ දී පැවැත්වීමට නියමිත බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. **සපුරාලිය යුතු සුදුසුකම්**

| කාර්යක්ෂමතා කඩඉම | කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යන්නේ කොපමණ වසර ගණනකට පසුවද | කාර්යක්ෂමතා ඉඩඉමේ ස්වභාවය |
|---|---|---|
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 3 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය |

03. විභාග පරිපාටිය - අපේක්ෂකයන් පහත සඳහන් විෂයයන් ඇතුලත් ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

04. **විභාගය පිළිබඳ විස්තර**

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40 |
| 2.මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 02 | 100 | 40 |

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| විෂයය | විෂයය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI,VII.VIII,XII,XIII,XIV,XVII,XXIV,XXV,XXVI,XXVII,XXVIII, XXX,XXXIII,XLVII,XLVIII හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති |
| 2.මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පරිච්ඡේද I,II,III,IV,V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |

06. උක්ත විභාගයට අදාළ අයදුම්පත පහත සබැඳිය ඔස්සේ " Google ෆෝරමය " මගින් **"2022 නොවැම්බර් 30"** වන දිනට පෙර යොමු කළ යුතු අතර විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනුයේ අයදුම්පත්‍ර මගින් ලබාදුන් තොරතුරු මත බැවින් අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේදි දී ඇති උපදෙස් අනුගමනය කරමින් නිවැරදිව යොමු කළ යුතුය.

සැබැඳිය:

https://forms.gle/MBaqbCmZxfH9T1o77

07. අයදුම්කරුවන්ගේ අවසන් ලේඛණය විද්‍යාතා වෙබ් පිටුවේ **2022.12.01** දින නිවේදනය කරන අතර අයදුම්පත යොමු කෙරෙන අවසාන දිනෙන් පසු ඉහත සබැඳියට පිවිසීමට නොහැක.

08. එක් අයදුම්කරුවෙකු විසින් එක් "Google ෆෝරමය" පමණක් සම්පූර්ණ කළ යුතු අතර අයදුම් කරන අවසන් දිනට , උක්ත 02 හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අදාළ විභාගය පැවැත්වෙන නිශ්චිත දිනය හා විභාග කාලසටහන විද්‍යාතා වෙබ් පිටුව මගින් දැනුවත් කරන අතර විභාග ප්‍රවේශ පත්‍රය තැපැලෙන් හෝ විද්‍යුත් ලිපිනය හරහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා යොමුකරනු ලබයි.

10. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය**

අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. විභාගයට සුදුසුකම් ලබන නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි ආසන්නතම මාණ්ඩලික නිලධාරින් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**ජේ.ක්‍රිෂ්ණමූර්ති**
අතිරේක ලේකම් (පාලන හා විදාතා )
අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම් වෙනුවට
2022.11.16